# සමාජ සංස්කෘතික හා රාජ්‍ය පරිපාලයේ තිරසාර සංවර්ධනය පිළිබඳ බෞද්ධ මතය

**වසන්ත කේ. දිසානායක**

### සාරාංශය

පෙරදිග ධාන්‍යාගාරයක් වූ අප රටේ තිරසාර සංවර්ධනය (Sustainability), සමාජාර්ථීක, සංස්කෘතික චිරජීවනය අවංකව ම ප්‍රාර්ථනා කරන නූතන දේශමාමක දේශපාලකයන්ට සැබෑ රජ දරුවන්ට අනුබුදු මිහිඳු හිමියන් විසින් ක්‍රිෘ පූ ෘ 3 වන සියවසේ දී අප රටට හඳුන්වා දුන් ප්‍රඥාගෝචර (සම්මා දිට්ඨි) සම්‍යක්දෘෂ්ටියෙන් පිරිපුන් බෞද්ධ දර්ශනය වූ කලී සුරභිධේනුවකි. සිතූ පැතූ සම්පත් ළඟාකරදෙන සිතුමිණකි. බුදුසමයෙන් සංවර්ධනය වූ එකී ඉපැරණි අපේ ලාංකේය ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය විවිධ වකවානුවල එල්ල වූ පරසතුරු බලවේග විසින් කඩා බිඳ දැමූව ද අතුපතර සිඳලීමෙන් වෘක්ෂයක් මරාදැමිය නො හැක්කා සේ අපට උරුම වූ එකී ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය අළු යට සැඟවී තිබෙන ගිනි පුපුරක් සේ නො පෙනෙනා බලවේගයක් සේ බලවත් ව යටපත් වී පවතින බව අප කිසිසේත් ම අමතක නො කළ යුතු ය. ලෝක වෙළඳ පොළ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි විදේශීය බලවේග කෙරෙහි පූර්ණ බලාපොරොත්තු නො තබා අපට ගැළපෙන අපට සුදුසු, අපට ම අනන්‍ය සාධාරණ වූ නිදහස් නිවහල් ස්වතන්ත්‍ර ස්වාධීන වූ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් සකස්කර ගත යුතු ය. අපට වෙනත් කිසිදු විසඳුමක් නැත.

අපේ ම රටේ ශ්‍රම බලකායට ස්වකීය ශ්‍රමය වපුරා නිෂ්පාදන කාර්යන්ට අවංකව ම දායකවීමට අවශ්‍ය පසුබිම රජය විසින් සැපයිය යුතු ය. ඒ අනුව ගොවිතැන් කටයුතු සිදු කරන ගොවීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම සහනදායි ක්‍රමයට ගොවි උපකරණ ලබාදීම්, මෙන් ම අස්වැන්නට ප්‍රමිතිගත මිලක් නියම කිරීම වැනි කටයුතු ද වෙළහෙළදාම් කරන්නන්ට අවශ්‍ය පහසුකම් ද විවිධ කර්මාන්තවල නියැළෙන්නන්ට එම කර්මාන්ත දිගින් දිගට ම පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබා දීම වශයෙන් ඉතාමත් සැලසුම් සහගත අර්ථක්‍රමයක් ගොඩනැඟීම රාජ්‍ය පාලකයන් සතු මූලික ම වගකීමකි. මුදල් බෙදා යාචක සංස්කෘතියක් බිහි නො කොට ශ්‍රමය යොදවා රටේ සියලු ම ජන කොටස් නිෂ්පාදන කාර්යන්ට සම්බන්ධකර ගැනීමෙන් රටේ නිෂ්පාදනය බහුල වී රටේ සියලු ම ජනතාවගේ සිතුම් පැතුම්වලට සරිලන පරිදි ස්වයංපෝෂිත අර්ථක්‍රමයක් ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියට හාත්පසින් ම

ගැළපෙන අපට ම අනන්‍යසාධාරණ වූ අර්ථක්‍රමයක් ගොඩනගා ගැනීම එතරම් අසීරු නැත. ලක්දිව පෙරදිග ධාන්‍යාගාරය බවට පත් කළේත් සදා නො මැකෙන ශිෂ්ටාචාරයක් රජරටින් බිහිකළේත් අපේ පෙර රජවරුන් බුදුසමය සමඟ අත්වැල් බැඳගනිමින් බුදුසමයෙන් අනුදත් අර්ථක්‍රමයක් අනුගමනය කිරීමෙනි. බුදුසමයෙන් අනුදත් අර්ථක්‍රමය ධර්මානුකූල යථාර්ථවාදී එකක් වන්නා සේ ම එය තිරසාර සංවර්ධනය සඳහා වඩාත් වැදගත් වන්නේ ප්‍රායෝගික මෙන් ම විද්‍යාත්මක ද වන බැවිනි.

## හැඳින්වීම

ක්‍රි.පූ. 6 වන සියවසයේ දී භාරතයේ පැවති වෛදික, බ්‍රාහ්මණ, ආජීවක, ජටිලාදී විවිධ විෂම ආගමික සමාජ සංවිධානයන් සහමුලින් ම උඩුයටිකුරු කරමින් සමස්ත භාරත සමාජය ම නව මඟකට නව සමාජ සංවිධානයකට කැඳවීමට බුදුන් වහන්සේ සමත් වූ සේක. උන් වහන්සේගේ දර්ශනය වූ කලී විමුක්තිය සඳහා පමණක් සීමාවන විඥ්ඥාණවාදී පාරභෞතික සංකල්පයක් නො ව මිනිසාගේ ඓහලෞකික පාරලෞකික යන දෙයංශයෙහි ම ගැටලුවලට නිසි පිළියම් සපයන සුවිශේෂවූ සංකල්පයකි. බුදුන් වහන්සේ ලොවට හඳුන්වා දුන්නේ හේතුඵලවාදී දර්ශනයකි. එය නුවණින් දැකිය යුතු ස්පර්ශ කළයුතු නුවණින් ළඟාකරගත යුතු අපූර්වතම සංකල්පයකි. එය නුවණැත්තන් සඳහා පමණක් ගෝචර වන්නෙකි.

'පඤ්ඤාවන්තසායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස,' මගේ දහම නුවණමද (මෝඩයන්ට) ගෝචර නො වන බව උන් වහන්සේ ම දේශනා කරන්නට යෙදුණේ එ බැවිනි. නුවණැත්තෝ උන් වහන්සේගේ මෙම අනගි දර්ශනය අවබෝධ කොටගෙන නුවණින් ස්පර්ශකොට එය ම ක්‍රියාවට නංවා ලොව ම ජයගත්හ. දිග් විජය ප්‍රතිපත්තිය අතහැරදමා ධර්ම විජය ප්‍රතිපත්තිය යථාවාදී තථාකාරී ලෙස ක්‍රියාවට නැංවූ අශෝක රජු බෞද්ධ චක්‍රවර්තී රාජ්‍ය සංකල්පය හුදු භාරත දේශයට පමණක් නො ව මුහුදු සීමාවන් ඉක්මවා ජාත්‍යන්තර පාලන තන්ත්‍රයක් බවට පත්කිරීමට සමත් විය (**බෂාම්, 1995:67**). ඉරානය, ඉරාකය, බුරුමය, ලංකාව පමණක් නො ව මැසිඩෝනියාව, සිරියාව, මිසරය ආදි ග්‍රීක රාජ්‍ය ද චෝල පාණ්ඩ්‍යාදී රටවල් ද මෙකී ධර්මවිජය ප්‍රතිපත්තියෙන් ආලෝකය ලබා ජයගත් බව එතුමා සිය xiii වන ගිරි ලිපියෙන් සඳහන් කරයි (**ඤාණවිමල,1966:10-11**).

මෙකී දහම ප්‍රයෝගික යථාර්ථයක් කරගැනීමට රාජ්‍ය පාලකයකුට අවශ්‍ය වන්නේ "මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනෝමයා, (**ධම්මපදය,2002:3**) යැයි කී පරිදි සංවර වූ සමාධිගත සිතෙකි. 'සිත ඇත්නම් පත කුඩා ද' යැයි පැවසුවේ ද මෙ බැවිනි. බුදුදහම ප්‍රායෝගික දර්ශනයකි. එය ක්‍රියාවට නංවන්නා යථාවාදී තථාකාරී විය යුතු ය. රජු ධාර්මික විය යුතු ය. රජු අධාර්මික වීමෙන් රට විනාශමුඛයට පත් වන බව අතීතයේ සිට සමාජයේ මුල්බැසගෙන ඇති සංකල්පයකි (**පඤ්ඤාකිත්ති,2001:15-16**). සීල, සමාධි, ප්‍රඥා වැනි අවි ආයුධවලින් සන්නද්ධ විය යුතු ය. පරාර්ථ චර්යාව, සමාජ ශුභ සිද්ධිය සැබෑ ලෙස අර්ථවත් වීමට පළමුකොට ම

තමන් නිසි තැනට පත්විය යුතු ය. සුදුසුකම්වලින් සමන්විත විය යුතු ම ය. 'අතතානං රක්ඛන්තො පරං රක්ඛති, තමන් රකින්නා අනුන් ද රකින්නෙකි.

අත්තානමෙව පඨමං පතිරූපෙ නිවාසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය නකිලෙස්සෙය්‍ය පණ්ඩිතො **(ධම්මපදය 2005 88)**

නිදහස් නිවහල්ව නුවණින් මෙම දහම දැකිය යුතු ය. ඒ සඳහා නිරවුල් මනසක් පිරිපුන් දැනුමක් පැවතිය යුතු ය.

එථ තුම්හෙ කාලාමා මා අනුසසවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මාපිටක සම්පදානෙන මා තක්ක හෙතු, මා නය හෙතු, මා ආකාර පරිවිතක්කෙන, මා දිට්ඨි නිජ්ජා නක්ඛන්තියා, මා බබ්බරූපතාය, මා සමනො ගරූති, 'යදා තුම්හෙ කාලාම අත්තනාව ජානෙය්‍යාථ ඉමෙ ධම්මා, සාවජ්ජා විඤ්ඤූගරහිතා සමන්තා සමාදින්නා ත්‍ව'

**(අංගුත්තර නිකාය, කාලාම සූත්ත)**

බුදුන් වහන්සේ කාලාම සූත්‍රයේ දී කාලාමයන්ට දේශනා කරන්නේ ඇසූ පමණින්, කවුරුත් කී පමණින් පොතක පතක තිබූ පමණින්, පරම්පරාවෙන් පැවත ආ පමණින් තමන්ගේ ම ගුරුවරයා කී පමණින් නො පිළිගෙන තමන්ගේ ම නුවණින් මෙනෙහි කොට මේ දේ හරිය මේ දේ වැරදිය යනුවෙන් වටහාගත යුතු බව යි. අවුල් වියවුල් වූ මනසකින් තොර ව නිදහස් නිවහල් ව තීරණ ගැනීමේ ශක්තිය රාජ්‍ය පාලකයෙක් සතුවිය යුතු සුවිශේෂතම ගුණ ධර්මයකි. කාලාමට බුදුන් වහන්සේ පෙන්වා දෙනු ලැබුවේ එකී මූලික ගුණධර්මය යි. බුදුන් වහන්සේගෙන් පසු ව ධර්මවිජය ප්‍රතිපත්තියෙහි පිහිටා අශෝක රජු බුදුදහම භාරතයේ රාජ්‍ය ආගම බවට පත්කොට එය ක්‍රියාවට නංවා පෙන්නුම් කළේ මෙකී යථාර්ථය යි **(රාහුල හිමි වල්පොළ.,2002,65-66).**

ලක්දිව, බුදුදහම ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ යුතු සුදුසු ම කාලය මෙය යි. බුදුදහම බලවත් ය. එ මෙන් ම ප්‍රාණවත් ය. අශෝක පුත් මිහිඳු හිමියන් ලක්දිවට උරුම කරදුන් එකී ශක්තිමත් සමාජාගමික ආර්ථික, දේශපාලන සංවර්ධනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් එදාට මෙන් ම අදටත් වලංගු ය. අන්‍යාගමිකයන් පවා සැගිරියට ගොස් (චාරිත්ත මනුපාලයං) පෙරසිරිතට ගරුකරමින් භික්ෂූන් වහන්සේට ආරාධනා කොට තමන් බෞද්ධයන් ලෙස ප්‍රකාශ කරමින් රාජ්‍යත්වය තහවුරුකරගත් දේශපාලන ඉතිහාසයක් අපට ඇත **(මහාවංශය, 21පරි,21-22).** මෙය වඩාත් පැහැදිලිවන්නේ එළාර රජු අනුරපුර පාලනය කළ කාලයේ දී ය. මහාවංශ කතුවරයා එළාර රජු ඉතා දැහැමි පාලකයෙකු බවත් රාජ්‍යයේ ආගම වශයෙන් බුදුසමය පිළිගන්නා ලද බවත් විහාරාරාම විනාශ කිරීමට දඬුවම මරණය බවත් ප්‍රකාශ කර සිටී **(මහාවංශ ගීතය1,1993:21සග,262-267).**

භික්ෂුව හා පාලකයා වනාහි දෙයාකාරී අරමුණු මත සංවිධානය වූ එනම් ලෞකික හා ලෝකෝත්තර දෙ අංශයෙහි අරමුණු මත පිහිටා ක්‍රියාත්මක වන්නා වූ ආයතන දෙකක ක්‍රියාකාරී නියමුවෝ ලෙස ප්‍රතිපත්තිමය වශයෙන් වෙන්ව ගමන්

ගත්ත ද ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේ දී දැඩි බැඳීමකින් නිරන්තර ව කටයුතු කළහ **(ධීරානන්ද හිමි,2005:248)**. බුදුසමය මේ අන්දමින් ප්‍රමුඛස්ථානයට පත්වීමත් සමඟ ආගමේ ලෞකික නායකත්වය රජුට හිමි විය. එ බැවින් සියලු ම සංඝ සභාවල මූලාසනය රජුට වෙන්කරන ලදි. ථූපාරාමයේ කනීරජානුතිස්ස රජු භික්ෂූන් දෙපක්ෂයක් අතර වූ ආරවුලක් විසඳූ ආකාරය මහාවංශයේත් මහාවංශ අටුවාවේත් සඳහන් වේ **(මහාවංශ ගීතය1,1993:35සග,441)**. සංඝ සමඟිය රාජ්‍යත්වයේ ස්ථාවරත්වය සඳහා ඍජු ව ම බලපෑ අතර එම කටයුත්තේ පූර්ණ වගකීම රජුට පැවරී තිබූ අයුරු එයින් මැනවින් පැහැදිලි වේ.

එකල රාජ්‍යයත් ආගමත් ඓන්ද්‍රය ව බද්ධ ව පැවතුණි. රාජ්‍ය පාලකයන්ට බුද්ධ ආඥාවට අනුගාමී ව කටයුතු කිරීමට හැකි වන පරිදි අගනගරය ද ඇතුළත් වන සේ සීමා බන්ධන පනවන ලෙස දේවානම් පියතිස්ස රජු මිහිඳු හිමියන්ට පැවසූ අදහස සුළු කොට තැකිය යුතු නො වේ. ක්‍රි. පූ. තෙවන සියවස පටන් සිංහල රාජ්‍යය ඉංග්‍රීසීන්ට යටත් වන තෙක් ලංකා රාජ්‍යට නීතියෙන් උරුමකම් කිවහැකි වූයේ බෞද්ධයෙකුට පමණි. එය තවදුරටත් තහවුරු වීමක් ලෙස ක්‍රි. ව 10 වන සියවසෙහි සිව්වන මිහිඳු රජුගේ (ක්‍රි .ව. 956-972) ශිලා ලිපිය (4 **මිහිඳු සෙල්ලිපිය, EZ 1,**234-237) අන්තර්ගත "බෝධි සත්වයන් හැර අන් කිසිවෙක් ශ්‍රී ලංකාවෙහි රජ නො වන්නේ ය, මේ විවරණය ලැබුණේ සර්වඥ බුදුන් වහන්සේගෙන් ම ය" යන සඳහනෙන් සනාථ වේ **(රාහුල,1962:93)**. බුදුන් වහන්සේගේ පා පහස ලැබ පාරිශුද්ධ වූ මෙම භූමිය "ධර්මද්වීපයක්"යන සංකල්පයෙන් පෝෂණය කළේ රාජ්‍ය හා දේශපාලන මතවාදයන්ට අත්‍යවශ්‍ය කාරණා පෙරදැරිව ය. දුටු ගැමුණු රජු දමිළ බලයට එරෙහි ව සංග්‍රාමයට අවතීර්ණ වන්නේ යුද්ධයේ දී ඇති වන යම් යම් අභියෝග ජයගැන්ම සඳහා ආගමේ නාමයෙන් සත්‍යග්‍රහ කරනු ලබන්නේ ද මෙම කරුණු සනාථ කරනු පිණිස ය. "මාගේ මෙම ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස ය"යනුවෙන් පවසා සංග්‍රාමයට අවතීර්ණ වීමෙන් ඒ බව මනාව විශද වේ **(වාච්චගේ ,2005:32)**. දුටුගැමුණු රජු සංඝයාගේ ආශීර්වාදය යුද්ධ කාර්යේ දී මෙන් ම යුද්ධයෙන් ජයගත් පසුවත් ලබාගැනීමෙන් අර්ථවත් වන්නේ භික්ෂූන්වහන්සේ ජාතියේ ම කුල දේවතාවුන් වශයෙන් සැලකූ බව ය.

භික්ෂුව ද ස්වකීය තත්වය ආරක්ෂා කරගනිමින් පත්තනික්කුජ්ජන කර්මය වැනි දඬුවම් රජවරුන්ට දීමට තරම් ශක්තියකින් සිටි බව මහාවංශය තව දුරටත් සඳහන් කරයි **(මහාවංශ ගීතය1,1993:33සග,413)**. ක්‍රි.පූ. 119 දී සද්ධාතිස්ස රජුගේ අභාවයෙන් පසු රජුගේ වැඩිමහලු පුතු සිටියදී බාලපුතු වන ථුල්ලත්තන රාජ්‍යයේ අභිෂේක කළේ භික්ෂූන්ගේ අභිලාෂය පරිදි ය. බුදුසමය රාජ්‍යාගම වුව ද සම්ප්‍රදායන් උල්ලංඝනය කරමින් අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීමට භික්ෂූන්වහන්සේට ද බුදුසමයෙන් ඉඩහසරක් නොමැති බව මෙම පත්කිරීම අසාර්ථක වූ බව මහාවංශය පරිහරණය කිරීමෙන් ම මොනවට පැහැදිලි වේ **(මහාවංශ ගීතය1,1993:33සග,413)**. ක්‍රි.පූ. 103න් පසු ව සිදුවූ ද්‍රවිඩ ආක්‍රමණවලින් පුරා දොළොස් වර්ෂයක් මුළු රට ම දුර්භික්ෂයෙන් වෙලාගනිද්දී රට බේරා ගැනීමට ඉදිරියට පැමිණි මහාතිස්ස, ත්‍රිපිටක

චූලනාග, උපතිස්ස වැනි තෙරවරුන් කොළ වර්ග වළඳමින් ඉතා දුෂ්කර දිවිපෙවතක් ගත කරමින් වළගම්බා රජු රැකගනිමින් මෙකී පරසතුරන් මෙ රටින් පලවා හැරීමට දිවි දෙවැනි කොට කටයුතු කළ බව අපට කිසිසේත් ම අමතක කළ නො හැකි ය **(මහාවංශ ගීතය1,1993:33සග,417).** එ මෙන් ම මෙ වන් විපත්වලින් ධර්මය ආරක්ෂා කරනු වස් වළගම්බා රජුගේ සම්පූර්ණ රාජ්‍ය අනුග්‍රහය යටතේ මාතලේ අළුවිහාරයෙහි දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ද විශේෂයෙන් ම සඳහන් කළ යුත්තකි **(මහාවංශ ගීතය1,1993:33සග,423).**

රාජ්‍ය සංස්ථාවත් බුදුසමයත් මාර්ග දෙකක නො ව එක මඟක ගමන් කළ යුතු ය. දේවානම්ප්‍රිය ප්‍රියදර්ශී නායකත්වයක් රජුගෙන් අපේක්ෂා කළ හැක්කේ එවිට ය. බුදුසමයට අනුව රටේ නායකයා ජනතාවට පරමාදර්ශී කෙනෙකු විය යුතු ය. 'ගවංචේ තරමානානං උජුං ගච්ඡන්ති පුංගවො' ගවරැළේ නායකයා ඇදට ගමන් කළහොත් සමස්ත ගවරැළ ම ගමන්කරන්නේ ම ඇදට ය.

භික්ෂූන් තම ධාර්මික ප්‍රතිපත්ති ගෙනයාම සඳහා අදාළ දේශපාලන න්‍යාය ධර්ම හා මිථ්‍යාකතා ඔස්සේ යම් යම් දේශපාලන මතවාද ගොඩනැඟීමට පෙළඹුණේ සිය රටෙහි, ජාතියෙහි, ආගමෙහි හා වැසියන්ගේ ආරක්ෂාව සහ අභිවෘද්ධිය පිණිස ය **(වාච්චගේ,2005:37).** ලෝකයේ වෙනත් රටවලට වඩා ශ්‍රී ලාංකේය ජනතාවගේ සිතුම්පැතුම් සියලු අපේක්ෂා පෝෂණය වූයේත් වන්නේත් බුදුදහම ඇසුරෙනි. අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා, මෙන් ම කරුණාව, දයාව, මෛත්‍රිය. මෙන් ම අටලෝදහමින් කම්පා නො වීම, වැනි උත්තරීතර ගුණාංග වෙනත් ජාතීන්ට වඩා අප සතු ව පවතින්නේ බුදුසමයෙන් ලත් පෝෂණය හා රාජ්‍යයේ ආගම බුදුදහම වීම නිසා ම ය.

ලක්දිව රාජ්‍ය අනුග්‍රහය ඇති ව පැවැත් වූ ප්‍රථම රාජකීය උත්සවය 'අරියවංශ දේශනා' නම් විය. භික්ෂුවගේ පාරිශුද්ධත්වය ගිහියන් ඉදිරියේ ම විමසා බැලීම මෙම උත්සවයේ මුඛ්‍ය පරමාර්ථය යි. 'අරියවංශ දේශනා' උත්සවය පවත්වන ලද්දේ දැහැමි සමාජය තුළ නව ආකල්ප ඇතිකරනු සඳහා ය. ධනාත්මක ආකල්ප සංවර්ධනය සමාජ සුභසිද්ධිය සඳහා ඍජු ව ම බලපාන්නකි. යථාවාදී තථාකාරී සමාජ රාමුවක් සකස්වන්නේ එවිට ය. මෙම උත්තුංග ගුණාංගය ජනතාව පිළිගත් රාජ්‍ය පිළිගත් සිද්ධාන්තයක් විය යුතු ය. පාලකයාගේ සිට පාලිතයා දක්වා මෙම ගුණාංගය අකුරට ම ක්‍රියාත්මක විය යුතු ය. බුදුදහම ප්‍රායෝගික දහමක් වන්නේ එවිට ය.

යථාවාදී තථාකාරී ගුණාංගය රාජ්‍ය සිද්ධාන්තයක් පමණක් නො ව ප්‍රායෝගික රාජ්‍ය සිද්ධාන්තයක් විය යුතු බව හා අවධාරණය කරන්නේ එය අපේ ඉපැරණි රාජ්‍ය සංස්ථාව සතු ව පැවති උතුම් ම ගුණාංගයක් වූ බැවිනි. ශ්‍රී ලාංකේය අතීත ශ්‍රී විභූතියට හේතුපාදක වූයේ එය යි. දන් දිය යුත්තේ තමන්ගේ ම වස්තුව ධනය වියපැහැදම් කොට ය. වෙහෙස මහන්සිවී වගාකොට ලත් අස්වනුවලින් දන්දිය යුතු ය. දානය අර්ථාන්විත වන්නේ එවිට ය. "සෙදාවක්ඛිත්තේහි බාහාබල පරිච්තේහි ධම්මිකෙනි ධම්ම ලද්දෙනි භොගේහි" **(චක්කවත්ති සීහනාද සූත්‍රය)** සද්ධාතිස්ස රජු වෙස්වලාගෙන කුඹුරක් කොටා අස්වැන්න කපා එයින් ලද නව අස්වනුවලින්

දානයක් දුන් බව අපේ **විනය අට්ඨකථාව** සඳහන් කරයි. මෙ වන් නිදසුන් අප්‍රමාණ අපේ ඉතිහාසයෙන් සොයා ගැනීම එ තරම් අසීරු නො වේ.

බුදු සමයත් රාජ්‍යයත් අතර සම්බන්ධතාව බිඳුණු සෑම අවස්ථාවක ම සමාජ, ආර්ථික, සංස්කෘතික යනාදි සියලු ක්ෂේත්‍රයන් ම පිරිහීමට පත් වූ බවත් බුදු සමය ද පිරිහීමට ලක් වූ බවත් සද්ධාතිස්ස රජුගෙන් පසු කාලය දෙස බලන විට මැනවින් පෙනී යයි. භාතිකාභය (ක්‍රි.පූ. 19 ක්‍රි.ව. 9) රජු මෙම අසහනකාරී තත්වයෙන් අප ජනතාව මුදාගන්නා තුරු රට පාලනය කළ පාලකවරුන් දහසය දෙනාගෙන් සිදු වූ යහපතක් නැත. ජාත්‍යන්තර කීර්තියට පත් භාතිකාභය රජු ග්‍රීසියේ රාජ්‍ය නායකයා සමඟ සබඳතා පවත්වා ග්‍රීසියෙන් පබළු ගෙන්වා රුවන්වැලි සෑයේ තැන්පත් කළ බව **මහාවංසයේ** සඳහන් කරයි **(මහාවංශ ගීතය1,1993:34සග,431).** දැහැමි දිවිපෙවත, සුබනම්‍ය ජීවිතය, බුදු සමයෙන් පෝෂණය කරගත් අපේ බෞද්ධ ජනතාව බුදුසමයෙන් අනුමත සෞන්දර්ය ජීවිතය ද අමතක කළේ නැත. ජනතාවගේ චින්තනය බෞද්ධ සිතුම් පැතුම්වලින් පිරි ඉතිරී ගියේ ය. සිත් පිත් නැති ගස් ගල් පර්වත විතරාගී ගුණයෙන් පරිපූර්ණ බුදුවරුන් බවට පත්කිරීමට අප ජනතාවට හැකිවූයේ එ බැවිනි. රජුගේ අභිප්‍රායන් බුදු සමයේ ද අභිප්‍රායන් විය. රාජ්‍ය තන්ත්‍රය බුදු සමයට අනුව සකස් විය. රාජ්‍ය පාලකයන්, ජනතාව, බුදු සමයත් සමඟ අත්වැල් බැඳ ගත්හ. සැවොම එක්ව ක්‍රියා කළහ.

භාතිකාභය රජු මහාවිහාරය, අභයගිරිය වශයෙන් භේද නො සලකා සමාන ව සලකා ආරාමවලට ලාභ සීමා පනවා ආරාමගත ධනය සාසනයේ පැවැත්මට යොමු කළේ ය. සංඝපාලනය විමධ්‍යගත කොට ආරාමවල විහාරාධිපතිවරුන් මාරුකිරීමේ ක්‍රමයක් ද සෑම විහාරයකට ම බලපාන පරිදි ලේකම්, අධිකාරී, හා භාණ්ඩාගාරික යන තිදෙනා ඇතුළත් වන පරිදි පාලන මණ්ඩලයක් ද පත්කොට සංඝසන්තක ධනයට එම මණ්ඩලය වගකිවයුතු බව ද කිසිදු ද්‍රව්‍යයක්, මිල මුදල් තනි තනි ව පාවිච්චි නො කළ යුතු බව ද නිර්දේශ කරන ලදි. භාතිකාභය සමයේ ඇතිවූ මේ ප්‍රබෝධය තුළින් බුදුසසුන ද ඉතා ඉහළ තත්වයට දියුණුවූ බවත් ධර්මකථික භික්ෂූන්ට විශේෂ වරප්‍රසාද ලබාදී ඔවුන්ට සංග්‍රහ කළ බවත් **මහාවංශය** සඳහන් කරයි **(මහාවංශ ගීතය1,1993:34සග,433-437).** භාතිකාභයගෙන් පසු ව පාලනයට පැමිණි 'මහාදාඨික මහානාම, රජු මුළු රාජ්‍යය ම බුදුසමයට පූජා කළ බව මහාවංශය සඳහන් කරයි. **(මහාවංශ ගීතය1,1993:34සග,).** එපමණක් නො ව බුදුදහම රාජ්‍යාගම වීම නිසා මිනිසුන්ගේ ලෞකික අපේක්ෂාවන්ට ගරු කිරීමක් වශයෙන් දින හතක් මුළුල්ලේ ගිරිභණ්ඩ, නම් වූ අසිරිමත් උත්සවයක් රාජ්‍යානුග්‍රහය ඇති ව නව නැඹුරුවකින් යුතු ව සංවිධානය කළ බවත් එය අම්බස්තල මහාථූපයේ වැඩ නිමවීමේ ප්‍රීතිය නිමිති කොටගෙන පැවත් වූ බව ද හෙන්රි පාකර් සඳහන් කරයි (**Parker.,1909,32-35**). විහාරස්ථාන ඉදිකිරීම, දාගැබ් තැනීම බුදු පිළිම තෙළීම, භික්ෂුවගේ හෝ ජනතාවගේ කාර්යභාරයක් මතු නො ව රජයේ ද කාර්යභාරයක් ම වූ බවට මෙය කදිම සාධකයකි. එය ආදර්ශයෙන් පෙන් වූ අපගේ රජවරුන් රාජ්‍යත්වයට පැමිණීමෙන් පසු ප්‍රථමයෙන් සිදුකළේ දන් දීම්, ගම්වර දීම්, ආරාම කරවීම හෝ පිළිසකර කරවීම

ආගමික උත්සව පැවැත්වීම යනාදී වූ පින්කම් සිදුකර සසුන කෙරෙහි තම උනන්දුව දැක්වීම යි **(රාහුල,1962:102).**

බුදුදහම රාජ්‍ය ආගම වීම නිසා ආමණ්ඩ ගාමිණී අභය රජු 'මාඝාත' ආඥාව පැන වී ය **(මහාවංශ ගීතය1,1993:35සග,).** ප්‍රාණඝාතය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කෙරිණි. ගිහි ජනතාව ප්‍රාණඝාතයෙන් සම්පූර්ණ වශයෙන් ම ඉවත් ව සිටි බව **පපඤ්චසූදනි නම් වූ මජ්ඣිම නිකා** අටුවාව සඳහන් කරයි. මස් මාංස ප්‍රතික්ෂේප කරන, සුරා සූදුව ප්‍රතික්ෂේප කරන කරුණාව දයාව, මෛත්‍රිය, පරෝපකාරය වැනි උතුම් ගුණාංගවලින් පරිපෝෂිත ජනතාවකගෙන් පාලකයන්ගෙන් සමන්විත රටක් මිහිමත දෙව්ලොවකි. මෙ වන් රටක පාලකයා වූ කලී සක්විති රජකෙනෙක් ම වන්නේ ම ය. ගමක් ගමක් පාසා වෙස්වළාගෙන ගොස් ජනතාවගේ දුකසැප සොයා බලන ඔවුහු සමාජ සුභසිද්ධිය සඳහා ම සිය දිවිය ම කැප කරන්නාහ. බුද්ධදාස රජු ගමක් පාසා දහම් දෙසන භික්ෂූන්වහන්සේලාට ගරු සැලකිලි කළා පමණක් නො ව වැටුපක් ද නියම කොට ඇත. **මිහින්තලා පුවරු ලිපියේ** සඳහන්කොට ඇත. 'කඬින් පිඬින් වසග් පසක් සුත්තවලා කියන බික්සඟ්හිමියනට් වසග් සතක් ඉසා බිදම්වළා කියන බික් සඟ් හිමියනට් වසග් දොළසක් ඉසා දියයුතු' **(ලගමුව,2009:84-85)** යන්නෙන් ධර්මකථී භික්ෂූන්ට සිවුරු හා පිණ්ඩාහාර ලබාගැනීම සඳහා කහවණු දොළසක් නියමකොට ඇත. මෙ මගින් පැහැදිලිවන්නේ ධර්මදේශනා පැවැත්වීම හුදු භික්ෂුවගේ ම කාර්යාභාරයක් හෝ වගකීමක් පමණක් නො ව එය රාජ්‍යයේ ද පූර්ණ වගකීමක් වන බව යි.

ධර්මදේශකයන් රට පුරා සැරිසරමින් දහම් දෙසමින් සුචරිතය වපුරමින් දැහැමි සමාජයක් නිර්මාණය කිරීම එක් පොහොයකට එක් කලකට සීමාවිය යුතු හුදෙක් භික්ෂූන්ටවත් ජනතාවටවත් තනි තනි ව සිදුකළ හැකි සිදු කළ යුතු කාර්යක් නො ව එය රාජ්‍ය මට්ටමින් රජුගේ පූර්ණ අනුග්‍රහය සහිත ව සිදු විය යුත්තක් බව අප වටහාගත යුතු ය.

භික්ෂුව ආත්මාර්ථකාමීත්වය පසෙක තබා පරාර්ථචර්යාවට එළඹුණු යතිවරයෙකි. පෞද්ගලික සුඛවිහරණ ලාභ අපේක්ෂා භික්ෂුවට නැත. 'සපතත භාරො පකඛි සකුණොවිය භිකඛු' පියාපත් දෙකේ පමණක් බර ඇති පක්ෂියෙක්වන් භික්ෂුවගේ දිවිපෙවත චාම් ය, සරල ය, සුගම ය. අපිස්ගුණයෙන් පරිපූර්ණ ය. එ බඳු ගුණැති භික්ෂුව ලෝකය පිළිබඳ ව මෙන් ම තමා පිළිවෙත් මනා අවබෝධයකින් කටයුතු කළ යුතු ය. ත්‍රිලක්ෂණ ධර්මතා අවබෝධ කර ගැනීමට උත්සාහ ගත යුතු ය. එ මෙන් ම පුහුදුන් ජනයා සසර කතරින් එතර කරවීමට අවැසි මඟ නිවැරදි ව පෙන්වා දිය යුතු ය. පෙන්වා දීමෙන් අනුශාසනා දීමෙන් නො නැවතී ආදර්ශයෙන් ද ක්‍රියාත්මක විය යුතු ය. සාංඝික ක්‍රමය ඒ සඳහා යොදාගතහැකි සරල ම සාධකයකි.

ආත්මාර්ථකාමීත්වය, තෘෂ්ණාව ප්‍රතික්ෂේප වන පොදු දේපළ ක්‍රමය, බෞද්ධ සමාජ සංවර්ධන න්‍යායේ විද්‍යමානවන සනාතන වටිනාකම යි. මෙ වන් වටිනා අර්ථක්‍රමයක් මුළු විශ්වය පුරා ම සර්ව භෞමික සාර්වත්‍රික වශයෙන් යොදාගත හැකි ය. පුද්ගල ගැටුම්, සමාජ ගැටුම්, පොදුජන චින්තනය ක්‍රියාත්මක වීම එහි දැකගත

නො හැකි ය. සමඟි ව රැස්වීම, සමඟි ව සාකච්ඡා කිරීම, සමඟි ව විසිර යාම යනාදී කොට ඇති සප්ත අපරිහානි ධර්ම ක්‍රියාත්මක වන ඕනෑම රටක පුද්ගල ගැටුම් සමාජ ගැටුම් කිසිසේත් ම දැකිය නො හැකි බව බුදුන් වහන්සේ ම එක් අවස්ථාවක ලිච්ඡවී රජදරුවන් නිදසුන් වශයෙන් ගෙන පෙන්වා දුන්හ. එපමණක් ද නො ව චක්කවත්ති සීහනාද **(දීඝනිකාය1,1948:1135-1159)** අග්ගඤ්ඤ, **(දීඝනිකාය1,1948:1159-1188)** කූටදන්ත **(දීඝනිකාය3,1959:403-509)** කලහවිවාද වැනි සූත්‍රවලින් මම ය මාගේ ය යන මමත්වයෙන් කටයුතු කරනතාක් පුද්ගල ගැටුම් සමාජ ගැටුම් තවතවත් උග්‍ර අතට හැරෙන බවත් එකී මමත්වයෙන් ඉවත් ව සාමූහික චින්තනයක පිහිටා කටයුතු කිරීමෙන් සමාජාර්ථික අභිවෘද්ධිය ළඟා කර ගත හැකි බවත් එකී සූත්‍ර පෙන්වා දෙයි.

ඒ අනුව යමින් දහවැනි සියවසේ දී හතරවන මිහිඳු රජුගේ ප්‍රකාශයෙන් සනාථ වන්නේ යමෙකුට රජකම මහා සංඝයා විසින් පවරනු ලබන්නේ ධාර්මික ප්‍රතිපත්ති මත ක්‍රියා කිරීමට රාජ්‍ය පාලකයා නිරන්තරයෙන් බැඳී සිටින බවක් හඟවමිනි. සිංහල ජාතියත් බුද්ධ ශාසනයත් ආරක්ෂා කිරීමට හැකි පුද්ගලයෙකුට සංඝයා වහන්සේගේ ද අනුමැතිය ඇති ව රජකම පවරා දුන් දකුණු ආසියාතික එක ම රට ශ්‍රී ලංකාව බව පැවසීම සාවද්‍ය නො වේ **(සෙනෙවිරත්න,2003:191).**

ක්‍රි. පූ. 3 වන සියවසේ දී මෙරටට වැඩම කළ මිහිඳුහිමියන් ප්‍රධාන බෞද්ධ දූත පිරිස දෙවනපෑතිස් රජු ප්‍රධාන ශ්‍රී ලාංකිකයන්ට හඳුන්වා දෙනු ලැබුවේ හුදෙක් මිනිසාගේ ආධ්‍යාත්මික විමුක්තිය කෙරෙහි පමණක් බලපාන්නා වූ තාපස දහමක් නො වේ. මිහිඳු හිමියන්ගේ ම දර්ශනය පරලොව ශුභසිද්ධිය සඳහා පමණක් හේතුභූත වූවානම් ශ්‍රී ලාංකේය ජන ජීවිතය ජන විඥානය එදත් අදත් පෝෂණය කරන ස්ථිරසාර බෞද්ධ කේන්ද්‍රීය සාරධර්මවලින් පරිපෝෂිත (Buddhist Central Value Systerm) ලොවට ම ආදර්ශමත් බෞද්ධ සමාජ අර්ථක්‍රමයක් සකස්වීමට කිසිසේත් ම ඉඩක් නැත. උන් වහන්සේ රජු ප්‍රධාන අප ජනතාවට ලබාදුන් එම දෘෂ්ටිමය දායකත්වය අති විශිෂ්ට ය. යාවත්කාලින ය, සර්ව භෞමික ය. සර්වකාලීන ය. ලෝකයා ම මවිත කරමින් සුවිශේෂී අර්ථක්‍රමයක් අප රටේ වැවෙන් වෙලෙන් උපන්නේ උන් වහන්සේගේ එම දෘෂ්ටිමය දායකත්වයට පිං සිදුවන්නට ය. එහි හරය, ගැඹුර අප මිහිතලය මත තව ම ශක්තිමත් ව සජීවී ව ද පවතී. වරෙක එය යට යමින් වරෙක එය උඩ එමින් ලොවට හාස්කම් දක්නවන්නට සමත් වී ඇත.

අතීතයේ සිට ම විහාරාරාම ඉදි කිරීම සඳහා පමණක් කැප නො වුණු ශ්‍රී ලාංකේය පාලකයෝ සසුන රැකගැනිමටත් ඒ සඳහා එල්ලවන අභියෝග හමු වේ භික්ෂුන්ගේ අනුගාමික පිරිස් ලෙසින් මූලික වී එල්ලවන තර්ජන මතවාද ගැටුම් මෙන් ම ශාසනික දුෂ්ප්‍රතිපත්ති ඉවත්කර හෝ අවම කිරීමට ක්‍රියා කළහ **(ධීරානන්ද හිමි,2005:253-254).** ඊට හේතු කාරණා වූයේ බුදුදහමත් රාජ්‍යත් එකිනෙකට බද්ධ ව පැවතුණ හෙයිනි. ආගමේ පරිහානිය රාජ්‍යත්වයේ පරිහානියට නිරතුරු ව ම බලපෑම් ඇතිකල සාධකයක් විය.

වර්තමානයේ බෞද්ධාගමට ඇති අභියෝග ඉදිරියේ භික්ෂුවත් රාජ්‍යයත් රටවැසියාත් අවධානය යොමු කළ යුතු කාලය පැමිණ ඇත.

## නිගමනය

අප රටේ පාලකයන්ට සැබෑ රජ දරුවන්ට රටේ සමාජ, ආර්ථික, සංස්කෘතික අභිවෘද්ධිය සඳහා අනුබුදු මිහිඳු හිමියන්ගේ දෘෂ්ටිමය දායකත්වය වූ කලී සුරභිධේනුවකි. සිඳු පැතූ සම්පත් ළඟාකර දෙන සිතුමිණකි. බුදුසමයෙන් සංවර්ධනය වූ එකී ඉපැරණි අපේ ලාංකේය ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය විවිධ වකවානුවල එල්ල වූ පරසතුරු බලවේග විසින් කඩා බිඳ දැමුව ද අතුපතර සිඳලීමෙන් වෘක්ෂයක් මරාදැමිය නො හැක්කා සේ අපට උරුම වූ එකී ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය අළුයට සැඟවී තිබෙන ගිනි පුපුරක් සේ නො පෙනී බලවේගයක් සේ බලවත් ව යටපත් වී පවතින බව අප කිසිසේත් ම අමතක නො කළ යුතු ය. ලෝක වෙළඳ පොළ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි විදේශීය බලවේග කෙරෙහි පූර්ණ බලාපොරොත්තු නො තබා අපට ගැළපෙන අපට සුදුසු, අපට ම අනන්‍ය සාධාරණ වූ නිදහස් නිවහල් ස්වතන්ත්‍ර ස්වාධීන වූ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් දේශීය අර්ථ රටාවක් සකස්කර ගත යුතු ය. අපට වෙනත් කිසිදු විසඳුමක් නැත.

අපේ ම රටේ ශ්‍රම බලකායට ස්වකීය ශ්‍රමය වපුරා නිෂ්පාදන කාර්යන්ට අවංකව ම දායකවීමට අවශ්‍ය පසුබිම රජය විසින් සැපයිය යුතු ය. ඒ අනුව ගොවිතැන් කටයුතු සිදු කරන ගොවීන්ට අවශ්‍යකරන පහසුකම් සැපයීම සහනදායි ක්‍රමයන්ට ගොවි උපරකණ ලබාදීම්, මෙන් ම අස්වැන්නට ප්‍රමිතිගත මිලක් නියම කිරීම වැනි කටයුතු ද වෙළහෙළඳාම් කරන්නට අවශ්‍ය පහසුකම් ද විවිධ කර්මාන්තවල නියැළෙන්නන්ට එම කර්මාන්ත දිගින් දිගට ම පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබා දීම වශයෙන් ඉතාමත් සැලසුම් සහගත අර්ථක්‍රමයක් ගොඩනැඟීම රාජ්‍ය පාලකයන් සතු මූලික ම වගකීමකි. මේ අන්දමින් ශ්‍රමය යොද වා රටේ සියලු ම ජනකොටස් නිෂ්පාදන කාර්යන්ට සම්බන්ධකර ගැනීමෙන් රටේ නිෂ්පාදනය බහුල වී රටේ සියලු ම ජනතාවගේ සිතුම්පැතුම්වලට සරිලන පරිදි ස්වයංපෝෂිත අර්ථක්‍රමයක් ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියට හාත්පසින් ම ගැළපෙන අපට ම අනන්‍යසාධාරණ වූ අර්ථක්‍රමයක් ගොඩනඟා ගැනීම එතරම් අසීරු නැත. ලක්දිව පෙරදිග ධාන්‍යාගාරය බවට පත්කළේත් සදා නො මැකෙන ශිෂ්ටාචාරයක් රජරටින් බිහිකළේත් අපේ පෙර රජවරුන් බුදුසමය සමඟ අත්වැල් බැඳ ගනිමින් බුදුසමයෙන් අනුදත් අර්ථක්‍රමයක් අනුගමනය කිරීමෙනි. බුදුසමයෙන් අනුදත් අර්ථක්‍රමය ධර්මානුකූල යථාර්ථවාදී එකක් වන්නාසේ ම රටේ තිරසාර සංවර්ධනය සඳහා එය වඩාත් වැදගත් වන්නේ විද්‍යාත්මක ද වන බැවිනි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ඇල්ටකාර්,ඒ.එස්.2004,**ඉන්දියාවේ රාජ්‍ය සහ ආණ්ඩුව**,(පරි),ඩී .ඇල්. අබේවර්ධන, නුගේගොඩ: සමන් මුද්‍රණාලය.

ඤාණවිමල හිමි,බෙල්ලන,1966,**අශෝක ශිලාලේඛන**, රාජගිරිය: මාධව ප්‍රකාශකයෝ.

තෝමස්,එඩ්වඩ්.ජේ,2013,**බෞද්ධ චින්තාවේ ඉතිහාසය**,(පරි)කරුණා සේනානායක,බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**දීඝනිකාය** 3,1995 (සංස්) ඒ.පී. ද සොයිසා, කොළඹ: ධර්ම සමය යන්ත්‍රාලය.

**දීඝනිකාය** 1,1948 (සංස්)පලන්නොරුවේ විමලධර්ම හිමි.

ධීරානන්ද හිමි,හඟුරන්කෙත, 2005, **පුරාතන ශ්‍රී ලංකාවේ සංඝ සංවිධානය සහ එහි ව්‍යුහාත්මක පදනම**, වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

පඤ්ඤාකිත්ති, හිරිපිටියේ, 2001, **පුරාතන භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම**,කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රනන්ද, කුලියාපිටියේ, 2010, **හෙළ ඉතිහාස සලකුණු හා මහා වංශයේ ඓතිහාසික දෘෂ්ටිය**, බත්තරමුල්ල:සදීපා ප්‍රකාශකයෝ.

බෂාම්, ඒ. එල්, 1995, **අසිරිමත් ඉන්දියාව**, මහරගම: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**මහාවංශගීතය**1, 1993, (සංස්) වෙව් අභයගුණවර්ධන,  අරීසෙන් අහුබුදු, අදො චන්ද්‍රසේකර, පාදුක්කඃරාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව, පළමු වෙළුම.

රාහුල හිමි, වල්පොල, 1962, **ලංකාවේ බුදුසමයෙහි ඉතිහාසය**, කොළඹ : එම්.ඩී. ගුණසේන සහ සමාගම.

වාච්චගේ, සුමනසිරි, 2005, **දුට්ඨගාමිණී අභය මහරජ**, මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.

සෙනෙවිරත්න, අනුරාධ, 2003, **ලක්දිව බුදුසසුන සහ සිංහල සංස්කෘතිය**, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ලගමුව, ආරිය, 2009, **මිහින්තලේ සෙල්ලිපි**, කර්තෘ ප්‍රකාශන.

Parker, H.:1909, **Ancient Ceylon**, London.

**Epigrapiya Zelanica**, 4 Vols. Oxford, University Press.